# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2116/24 – 2019 මාර්තු 26 වැනි අඟහරුවාදා – 2019.03.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/10/43/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2013.04.26 දිනැති හා අංක 1807/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.03.20 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් රඹුක්කන, කොටවැල්ල, ගබ්බිල, පිටකොටුව හි පදිංචි ඒ. ජී. ජීවා පුෂ්පකුමාර මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 609, ප්‍රධාන කාර්යාලයෙහි පිහිටි ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.01.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 29735 – 13 (2019/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කාර්මික අධිකරණයේ දී ය.**

ඒ. ජී. ජීවා පුෂ්ප කුමාර, පිටකොටුව, ගබ්බල, කොටවැල්ල, රඹුක්කන.

*නඩු අංකය: ඒ - 3510* ඉල්ලුම්කරු
*IR/10/43/2011*

*එදිරිව*

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ප්‍රධාන කාර්යාලය, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

අතර පවත්නා කාර්මික ආරවුල.

## ප්‍රදානය

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් ඉහත නම් සඳහන් පාර්ශවකරුවන් අතර වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2013.03.20 වැනි දින මාවෙත යොමු කරන ලදී.

කම්කරු කොමසාරිස්වරයා විසින් 2013.02.19 වැනි දින කාර්මික අධිකරණයට යොමුකර ඇති ලේඛනය අනුව ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහකාර විමර්ශන නිලධාරියෙකු ලෙස සේවයේ යෙදී සිටියදී ඇති වූ සිද්ධියක් මත 2011.01.06 දින සිට වැඩ තහනමකට ලක්ව පසුව සිදු කරන ලද විනය පරීක්ෂණයකින් අනතුරුව වැඩ තහනමකට ලක්ව සිටි කාලයට වැටුප් රහිතව, තරයේ අවවාද කර තනතුරින් ශ්‍රේණි දෙකක් පහත හෙලා ස්ථාන මාරුකර, ලබාදී ඇති දඬුවම මගින් ජී. ඒ. ජීවා පුෂ්ප කුමාර මහතාට යම් අසාධාරණයක් සිදුව තිබේද එසේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේද යන්න වේ.

2013.06.07 වැනි දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ ඛනිජ තෙල් සංස්ථාව වෙනුවෙන් ප්‍රකාශ කර සිටියේ ඉල්ලුම්කරුගේ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ද, ගොනු කළ ලේඛනවල පිටපත් ද, එම පාර්ශවයට ලැබී නොමැති බවය. එම නිසා පිළිතුරු ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට නොහැකි බවද දැනුම් දෙන ලදී. එහිදී පැහැදිලි වූ කරුණක් වූයේ ඉල්ලුම්කරු විසින් ලේඛන පමණක් ගොනු කර ඇතත් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර නොමැති බවයි. ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ලේඛන නම් ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කිරීමේ ලිපිය, වැඩ තහනම් කිරීමේ ලිපිය භාරගත් බව සනාථ කිරීමේ ලිපිය, චෝදනා පත්‍රය, චෝදනා පත්‍රයට නිදහසට කරුණු ඉදිරිපත් කළ ලේඛනය, අභ්‍යන්තර විනය පරීක්ෂණ වාර්තාව, විනය පරීක්ෂණය සඳහා ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කළ සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව, විනය පරීක්ෂණයෙන් පසු කොන්දේසි සහිතව නැවත සේවයට කැඳවීමේ ලිපිය, මානව සම්පත් කළමනාකරු වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය, කම්කරු කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සහ ලිඛිත දේශනය යි.

ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර නොමැතිවීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටියේ ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ලේඛන අතර 2011.01.14 වැනි දින කම්කරු කොමසාරිස් අමතා ව්‍යාජ චෝදනා ගොනු කර මාගේ වෘත්තීය ජීවිතයට කරන ලද හානිය පිළිබඳ පැමිණිල්ල නම් වූ ලේඛනය ඉදිරිපත් කර ඇති බවත් කම්කරු අමාත්‍යවරයා කම්කරු ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ මෙම ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා යොමු කර තිබෙන බවත් ය. එකී කරුණු සලකා බැලීමෙන් පසු මෙම කාර්මික ආරවුල සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කිරීම සඳහා එම ලේඛන ප්‍රමාණවත් බව තීරණය කළෙමි.

ඉල්ලුම්කාර පාර්ශවය වගඋත්තරකාර පාර්ශවයට අදාළ ලේඛනවල පිටපත් භාරදීමෙන් පසු 2013.06.28 වැනි දින වගඋත්තරකාර පාර්ශවයද විස්තර ප්‍රකාශයක් ගොනු කරන ලදී. (එම ලේඛනයේ ශීර්ෂයේ පාර්ශවකරුවන් හඳුන්වා ඇත්තේ ඉල්ලුම්කාර පාර්ශවය හා වගඋත්තරකාර පාර්ශවය ලෙසය.) එම විස්තර ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ අදාළ සිද්ධිය සම්බන්ධයෙන් 2011.01.06 වැනි දින ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කරන ලද බවත් 2011.01.28 වැනි දින ඉල්ලුම්කරුට චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වූ බවත් ය. එම විනය පරීක්ෂණයෙන් විත්තිකරු සියලු චෝදනාවලට වරදකරු බවට තීරණය කරන ලද බවත්, අනතුරුව වැඩ තහනමට ලක්ව සිටි කාලයේ හිඟ වැටුප් නොගෙවා තරයේ අවවාද කර ඉල්ලුම්කරු සිටි තනතුරින් ශ්‍රේණි දෙකක් පහත් කර 2011.07.01 වැනි දින සිට නැවත සේවයට කැඳවන ලද බවත් ය. එසේ නැවත සේවයට කැඳවන ලද්දේ කොන්දේසි පහකට යටත් කර බවත්, ඉල්ලුම්කරු එම කොන්දේසි යටතේ බී 4 ශ්‍රේණි ලේඛන භාරකාර තනතුර භාරගත් බවත් ය. ඉල්ලුම්කරු දක්වා ඇති කරුණු කාර්මික ආරවුලකට හේතුවන කරුණු නොවන බවත් එම නිසා ඉල්ලුම්කරුගේ පැමිණිල්ල නිෂ්ප්‍රභා කරන ලෙසත් වගඋත්තරකාර පාර්ශවය මෙම අධිකරණයෙන් ඉල්ලා ඇත.

2013.08.10 වැනි දින ඉල්ලුම්කරු වෙනුවෙන් ප්‍රතිඋත්තරයක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු වෙත පනවා ඇති දඬුවම සාක්ෂිවලට පටහැනි බවත්, අනානුකූල බවත්, අසාධාරණ හා ද්වේෂ සහගත බවත්, නීතියට පටහැනි බවත්, බල අතික්‍රමණය කර ඇති බවත්, වෙනත් අරමුණක් ඉෂ්ට කර ගැනීමේ අරමුණින් කරන ලද්දක් බවත් එකී දඬුවම ඉල්ලුම්කරුගේ හොඳ පැවැත්ම ගැන නොසලකා දී ඇති දඬුවමක් බවත් ය. ඒ අනුව ඉල්ලුම්කරු වෙත පනවා ඇති චෝදනා පත්‍රයත් සියලු චෝදනාවලින් ඉල්ලුම්කරු නිදොස් කොට නිදහස් කරන ලෙස වැඩිදුරටත් ඉල්ලා ඇත. එසේම 2011.01.06 වැනි දින සිට 2011.07.01 වැනි දින දක්වා හිඟ වැටුප් සියලු දීමනා සහ පඩි වැඩිවීම් සහිතව පෙර සේවා ස්ථානයේ පෙර සිටි සහකාර විමර්ශන තනතුරේ පිහිටුවීමට නියම කරන ලෙසද ඉල්ලා ඇත.

කාර්මික අධිකරණය විසින් විසඳීමට යොමුකර ඇති කාරණය වන්නේ විනය පරික්ෂණයෙන් අනතුරුව ලබාදී ඇති දඬුවම මගින් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුව තිබේද එසේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේද යන්නයි.

එසේ වුවද මෙම නඩුවට අදාළ ඉල්ලුම්කරු නිකවැරටිය සමුපකාර සමිතියට අයත් ඉන්ධන පිරවුම්හලේදී සිදුවූ සිද්ධිය පිළිබඳ සාක්ෂි දීම, වගඋත්තරකාර පක්ෂය ද එම සිද්ධිය සම්බන්ධයෙන් ලේඛන ලකුණු කරමින් හරස් ප්‍රශ්න ඇසීම, ඉල්ලුම්කරු වෙනුවෙන් ඉන්ධන පිරවුම්හලේ විමර්ශන කටයුතු කළ විමර්ශන නිලධාරි ඒ. ලක්ෂ්මන් ආනන්ද නැමති අය සාක්ෂියට කැඳවා සිද්ධිය සම්බන්ධයෙන් සාක්ෂි මෙහෙයවීම, වගඋත්තරකාර පාර්ශවය R වශයෙන් ලේඛනද ලකුණු කරමින් එම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීම හේතු කරගෙන නිකවැරටිය ඉන්ධන පිරවුම්හලේදී සිදුවූ සිද්ධිය සම්බන්ධවත් එම සිද්ධියේදී ඉල්ලුම්කරුගේ ක්‍රියාකලාපය කුමන ස්වභාවයක් ගත්තේ ද යන්න පිළිබඳවත් අවධානය යොමු කිරීමට මෙම අධිකරණයට සිදුවිය.

දෙපාර්ශවය අතර සමථයක් නොමැති බව ප්‍රකාශ වූයෙන් ඉල්ලුම්කරු විසින් ඉල්ලා ඇති සහන ලබාදීමට හැකියාවක් ඇත් ද, යන්න සලකා බැලීම සඳහා සාක්ෂි කැඳවීමට තීරණය කළෙමි. ඒ අනුව පළමුව ඉල්ලුම්කරු ද අනතුරුව ඉල්ලුම්කරු වෙනුවෙන් කැඳවන ලද සාක්ෂිකරුවෙකු වූ විමර්ශන නිලධාරි ඒ. ලක්ෂ්මන් ආනන්ද ද, සාක්ෂි ලබාදෙන ලදී.

ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් සංස්ථාවේ සේවකයෙකු ලෙස පත් කරන ලද ලිපිය, සේවය ස්ථිර කිරීමේ ලිපිය, උසස්වීම් ලැබීමේ ලිපිය, වැටුප් සංශෝධනයට අදාළ ලිපිය, ඉ වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එකී ලේඛන වගඋත්තරකාර පක්ෂය අභියෝගයට ලක් කළේ නැත.

ඉල්ලුම්කරු චෝදනාවට ලක්වූ සිද්ධිය වන්නේ 2010.11.13 නිකවැරටිය විවිධසේවා සමූපකාර සමිතියට අයත් ඉන්ධන පිරවුම්හලේ ක්ෂණික පරීක්ෂණයක් සඳහා ගිය පරීක්ෂණ නිලධාරි ඒ. ලක්ෂ්මන් ආනන්ද යන අයගේ දුරකතනයට ඇමතුම් ලබාදී අයථා බලපෑමක් සිදු කළේ ය, යන්නයි. ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ එදින ලක්ෂ්මන් ආනන්ද යන අයට දුරකතන ඇමතුම් දුන් නමුත් ඊට අදාළව ඔහුට එල්ල කරනු ලබන චෝදනා නොපිළිගන්නා බවයි.

ඉල්ලුම්කරු සාක්ෂි දෙන අවස්ථාවේ ඉල්ලුම්කරුට එරෙහිව පැවති අභ්‍යන්තර විනය පරීක්ෂණයේදී ලකුණු කර ඇති ඩයලොග් සමාගමේ දුරකතන ඇමතුම් වාර්තාවේ පිටපතක් ඉ6 ලෙස ලකුණු කරන ලදී. එසේම විනය පරීක්ෂණයේ දී ලක්ෂ්මන් ආනන්ද යන අය දෙන ලද සාක්ෂිය ඉ7 ලෙසද එම විනය පරීක්ෂණයේදී ඔහුගෙන් අසන ලද හරස් ප්‍රශ්න කොටස ඉ7 (අ) ලෙසද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම විනය පරීක්ෂණයේදී සංස්ථාවේ විධායක සහකාර ප්‍රියන්ත වැලිකල යන අය දෙන ලද සාක්ෂිය ඉ8 වශයෙනුත් එම විනය පරීක්ෂණයේ දී කංකානම්ගේ ගුණසේන නැමති අය දෙන ලද සාක්ෂිය ඉ9 වශයෙනුත්, විනය පරීක්ෂණයේදී ඉල්ලුම්කරු දෙන ලද සාක්ෂිය ඉ12 වශයෙනුත් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉ7 ලෙස ලකුණු කරන ලද්දේ ඉල්ලුම්කරුට විරුද්ධව සංස්ථාව විසින් පවත්වන ලද විනය පරීක්ෂණයේදී නිකවැරටිය පිරවුම්හලේ පරීක්ෂණ කටයුතු සිදුකළ ලක්ෂ්මන් ආනන්ද නැමති අය පැමිණිල්ල වෙනුවෙන් එනම් සංස්ථාව වෙනුවෙන් දෙන ලද සාක්ෂිය යි. ඉ7 (ඇ) ලෙස ලකුණු කරන ලද්දේ විනය පරීක්ෂණයේදී මූලික සාක්ෂිය දෙමින් ලක්ෂ්මන් ආනන්ද නැමති අයගේ සාක්ෂියේ කොටසකි. එම කොටස මෙසේ ය.

ප්‍ර : පුෂ්ප කුමාර මහතා ඔබට දුරකතනයෙන් මොනවද කියා සිටියේ ?

උ : වෙනදා වගේ සාමාන්‍ය දේ කතා කලා කතා කරල ඇහුවා කොහේද ඉන්නේ කියලා. මම කීවා නිකවැරටියේ පිරවුම්හලේ ඉන්නවා කියලා. සාම්පල් ගන්නවා කිව්වා. පුළුවන්නම් කළමනාකරුට උදව්වක් කරන්න කියා දුරකතනයෙන් කියා සිටියා.

ප්‍ර : කළමනාකරුට කොයි වගේ උදව්වක්ද කරන්න කිව්වේ ?

උ : කොයිවගේ ද කියලා කිව්වේ නැහැ.

එසේම විනය පරීක්ෂණයේ දී ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටි රැකවරණ නිලධාරියා සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න කොටස ඉ7(ඇ) ලකුණු කරන ලද අතර එම කොටස මෙසේ ය.

ප්‍ර : මම මේ අවස්ථාවේ යෝජනා කර සිටිනවා චූදිත ඔබට ප්‍රකාශ කර ඇත්තේ පුළුවන් නම් උදව්වක් කරන්න මිස අල්ලසක් චූදිත විසින් හෝ එකී අල්ලස වෙනත් අයෙකුට ලබාදීමට තැත් කිරීමක් නොකළ බව.

උ : යෝජනාව පිළිගන්නවා. ඔහු මට කීවේ පුළුවන් නම් උදව්වක් කරන්න කියා.

ඉල්ලුම්කරු වෙනුවෙන් ඉ9 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ විනය පරීක්ෂණයට පෙර ගෘහස්ථ පරීක්ෂණය සිදු කළ ජ්‍යෙෂ්ඨ පරීක්ෂණ නිලධාරි කංකානම්ගේ ගුණසේන නමැති අයගේ සාක්ෂියයි. එම සාක්ෂියේ අඩංගු කොටසක් ඉ9 (අ) ලෙස ලකුණු කරන ලදී.

ප්‍ර : මෙම පරීක්ෂණ පවත්වද්දී ඩයලොග් දුරකතන (ජංගම) සමාගමෙන් යම්කිසි විමසීමක් කළා ද?

උ : මම පැමිණිලිකරු ලක්ෂ්මන් ආනන්ද මහතාගේ දුරකතනයට අදාළ 2010.11.05 වන දින සිට 2010.12.04 දින දක්වා කාලයට අද ාළ දුරකතන අංක 077 31146472 හි සී. බී. ආර්. වොයිස් ඉන්පොමේෂන් ලේඛනය ආනන්ද මහතාගේ මාර්ගයෙන් ලබාගෙන එය පරීක්ෂා කර බැලිමි. මෙම ලේඛනය (ඩයලොග් සමාගමේ) පැ.2 ලෙස ලකුණු කර ඉදිරිපත් කරමි. එසේම එම සාක්ෂියේ තවත් කොටසක් ඉ9(ආ) ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ප්‍ර : පැ.2 ලේඛනය අනුව ජංගම දුරකතන අංක 077 2530460 දුරකතනයෙන් අංක 077 3146472 දුරකතන අංකයට 2010.11.13 වන දින ඇමතුම් කීයක් සටහන්වී තිබේ ද?

උ : පහක් ලබාගෙන ඇති බව පෙනේ.

තව ද මෙම නඩු විභාගයේ දී ඉල්ලුම්කරු මූලික සාක්ෂිය දෙමින් චෝදනා හතෙහි සඳහන් කරුණු නොපිළිගන්නා බව ප්‍රකාශ කළේ ය. එසේම ඉල්ලුම්කරු විසින් එම චෝදනාවලට නිදහසට කරුණු දක්වමින් ඉදිරිපත් කරන ලද ලේඛන **ඉ**14 ලෙසත්, විනය පරීක්ෂණයෙන් පසු දී ඇති දඬුවම් දක්වෙන ලේඛනය **ඉ**16 ලෙසත්, කොන්දේසි සහිතව රැකියාව බාරගත් ලිපියේ පිටපත **ඉ**17 ලෙසත්, අභියාචනයක් කළ බව දක්වෙන ලේඛනය **ඉ**18 ලෙසත්, කම්කරු කොමසාරිස් වෙත යොමුකර ඇති ලේඛනය **ඉ**19 ලෙසත් ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ ඔහු වෙත එල්ල කරන ලද චෝදනා හතටම නිවැරදිකරු බව ලිඛිතව ප්‍රකාශ කළ බවයි. කෙසේ වුවත් වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ප්‍රකාශ කළේ චෝදනා අංක 7ට නිවැරදිකරු බව ප්‍රකාශ කර නොමැති බවයි. එසේම හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ ඉන්ධන පිරවුම්හල් හිමියා සමග සම්බන්ධයක් නොතිබුණු බවත් ඔහුගේ දුරකතන අංකය ඔහු සතුව නොතිබුණු බවත් ය. එහෙත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටියේ ඉන්ධන පිරවුම්හලේ කළමනාකරුට උදව්වක් කරන්න කියා ලක්ෂ්මන් ආනන්ද නමැති අයට නොකී බවයි. එහෙත් ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කළ **ඉ**7 ලේඛනය පෙන්වමින් ප්‍රශ්න කළ විට එසේ කී බව පිළිගත්තේ ය. ඉල්ලුම්කරු වෙනුවෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛනවලින්ම තහවුරු වන්නේ ඉල්ලුම්කරු එවැනි ප්‍රකාශයක් කළ බවයි.

ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී ඩයලොග් ආයතනයෙන් ලබා ගන්නා ලද ඇමතුම් විස්තර අඩංගු ලේඛනය **R2** වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලේඛනය අනුව ඉල්ලුම්කරු ලක්ෂ්මන් ආනන්ද නමැති අයට ඇමතුම් පහක් ලබාගෙන ඇති බව පිළිගත්තේ ය. එසේම **R4** වශයෙන් ලකුණු කරන ලද ලේඛනය පෙන්වමින් ඉල්ලුම්කරුගේ දුරකතන අංකය අංක 407, 409, 419, 420 සහ 422 යටතේ තිබෙන බවත් එම දුරකතනවලට ඉදිරියෙන් ලක්ෂ්මන් ආනන්දගේ දුරකතන අංක තිබෙන බවත්, එම දුරකතන ඇමතුම් 2010.11.13 දිනට අදාළ බවත් ඉල්ලුම්කරු පිළිගත්තේ ය. එසේම ඉන්ධන පිරවුම් හලේ කළමනාකරු සමග සම්බන්ධතාවයක් නොමැති බව හා ඔහුගේ දුරකතන අංකය නොදන්නා බව ප්‍රකාශ කළ ද, ඉල්ලුම්කරු පසුව පිළිගත්තේ දියණිය පාසලට ඇතුළත් කිරීමේ කාරණයක් සම්බන්ධයෙන් ඊට පෙරදින ඔහු සමග කතා කර ඇති බවයි.

අදාළ දිනයේ දී විමර්ශන කටයුතුවල නිරතවී ඇති ලක්ෂ්මන් ආනන්ද මහතා පැමිණිලිකරු වෙනුවෙන් සාක්ෂිදීම සඳහා මෙම අධිකරණය හමුවට කැඳවන ලදී. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී සිද්ධියට අදාළ වැදගත් ලේඛන කිහිපයක් ද, ලකුණු කිරීමට වගඋත්තරකාර පාර්ශවයට හැකිවිය. ඒ අනුව R1 වශයෙන් ඉන්ධන පිරවුම්හලේ කළමනාකරුගේ ප්‍රකාශය ද, R2 ලෙස ඩයලොග් දුරකතන ආයතනයේ ඇමතුම් වාර්තාව ද, R3 ලෙස සංස්ථාව විසින් පවත්වන ලද පරීක්ෂණයේ දී ඉල්ලුම්කරු විසින් කරන ලද ප්‍රකාශය ද, R9 ලෙස සිද්ධියට අදාළව ලක්ෂ්මන් ආනන්ද නමැති අය සංස්ථාවට දෙන ලද ප්‍රකාශය ද ලකුණු කරන ලදී. ලක්ෂ්මන් ආනන්ද නමැති අයගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී සිද්ධිය පිළිබඳ කුමක්දැයි විමසූ විට ඔහු දුන් පිළිතුර මෙසේ ය.

''අපි සමුපකාර පිරවුම්හලට ගියා. පිරවුම්හලේ පෙට්‍රල් සාම්පල ලබා ගැනීම සඳහායි ගියේ. මා ඇතුළු තවත් දෙදෙනෙක් ගියා. උදේ වරුවෙ ගියේ. ගිහිල්ලා අපි සාම්පල් ලබා ගැනීමට උත්සාහ කරන අවස්ථාවේ පිරවුම්හලේ කළමනාකරු අපිට ඉඩ දුන්නේ

නැහැ. ඔහු කිව්වා මතක හැටියට රු. 30,000.00 ක් දෙන්නම් කියා. මට තමයි ඒක කිව්වේ. මම ඒක ප්‍රතික්ෂේප කරල අපි සාම්පල් අරගෙන ආවා."

සිද්ධියට පසු සිද්ධිය සම්බන්ධයෙන් එදිනම සංස්ථාවේ අලෙවි කළමනාකරුට දනුම්දුන් බව සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ ය. එසේම සිද්ධිය සම්බන්ධයෙන් ලක්ෂ්මන් ආනන්ද නමැති අය සංස්ථාවට දෙන ලද ලිඛිත ප්‍රකාශය ඔහුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථවේදී R9 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම එම ප්‍රකාශය අඩංගු කොටසක් R9 ඒ ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම කොටස මෙසේ ය :

''එම අවස්ථාවේදී මාගේ රාජකාරි දුරකතනයට ඇමතුම් ලබාදුන් පුද්ගලයෙකු තමා විමර්ශන අංශයේ සේවය කරන බී 11 ශ්‍රේණියේ සහකාර විමර්ශන නිලධාරි ඒ. ජීවා පුෂ්ප කුමාර බව මට හඳුන්වා දෙමින් මෙම අවස්ථවේ කරනු ලබන රාජකාරි කටයුත්ත පිළිබඳව විමසා සිටියා. අලෙවි කළමණාකාර (සිල්ලර) ගේ උපදෙස් මත මෙම ඉන්ධන පිරවුම්හලේ පෙට්‍රල් සාම්පල් ලබා ගැනීමට පැමිණි බව එම අවස්ථාවේ ඔහුට පවසා සිටියා. එහිදී ජීවා පුෂ්පකුමාර මහතා ඉන්ධන පිරවුම්හලේ කළමනාකරුට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටියා. ඒ සමගම එම ඉන්ධන පිරවුම්හලේ කළමනාකරු මා වෙත පැමිණ පෙට්‍රල් සාම්පල් පරීක්ෂාවට අදාළ සිද්ධිය වසන් කිරීම සඳහා සහ ඔහු බේරා ගැනීම සඳහා රු. 30,000 අල්ලස් මුදල් ලබාදෙන බව ප්‍රකාශ කළා. එම අවස්ථාවේ එම මුදල ලබා ගැනීම මා විසින් ප්‍රතික්ෂේප කළා ."

එම කොටස සාක්ෂිකරු විසින් කරන ලද ප්‍රකාශයක් බව සාක්ෂිකරු පිළිගන්නා ලදී. R10 ලෙස ලකුණු කරන ලද සාක්ෂිකරු විසින් කර ඇති ප්‍රකාශවල කොටස් ද, R12 ලෙස ලකුණු කළ විනය පරීක්ෂණයේ දී සාක්ෂිකරු සාක්ෂියේදී ලබාදී ඇති කොටස් ද හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී සලකුණු කරන ලදී. සාක්ෂිකරුට වගඋත්තරකරු වෙනුවෙන් යොමු කරන ලද ප්‍රශ්නවලට ලබාදෙන ලද පිළිතුර මගින් ද ලකුණු කරන ලද ලේඛන මගින් ද පිරවුම්හලේ සිද්ධියට අදාළ කරුණු ගණනාවක් අනාවරණය විය. සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී මතු කරන ලද කරුණු නැවත ප්‍රශ්නවලදී බිඳ හෙලුනේ නැති බව ද සඳහන් කළ යුතු වේ.

ඉල්ලුම්කරු මෙම පරීක්ෂණය පවත්වද්දී සඳහන් කළ කරුණක් වූයේ සංස්ථාව මගින් පවත්වන ලද විනය පරීක්ෂණයෙන් ඔහුට අසාධාරණයක් සිදුවූ බවයි. ඉල්ලුම්කරු සාක්ෂි දෙන අවස්ථාවේ දී වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් කරන ලද යෝජනාවක් වූයේ,

ප්‍ර : ඒ අනුව තමන්ට සාධාරණ හා අපක්ෂපාතී විනය පරීක්ෂණයක් පවත්වා සාධාරණ විනය දඬුවමක් දී ඇති බව යෝජනා කරනවා යන්නයි.

ඊට ද ඉල්ලුම්කරු දී ඇති පිළිතුර වූයේ නැත යන්නයි. ඉදිරිපත් වී ඇති ලේඛන අනුව පැහැදිලි වන්නේ ඉල්ලුම්කරුට චෝදනා පත්‍රයක් ලබාදී එම චෝදනාවලට ලිඛිතව ඉල්ලුම්කරු විසින් පැහැදිලි කිරීම් කිරීමෙන් පසු විනය පරීක්ෂණය පවත්වා ඇති බවයි. විනය පරීක්ෂණයේ දී ඉල්ලුම්කරු වෙනුවෙන් රැකවරණ නිලධාරියෙක් පෙනී සිට ඇති අතර ඔහු සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ද අසා ඇත. සාක්ෂි අවසන්වීමෙන් පසු රැකවරණ නිලධාරියා ඉල්ලුම්කරු වෙනුවෙන් ලිඛිත දේශනයක් ද ගොනු කර ඇත. එසේ තිබියදී විනය පරීක්ෂණය අයුක්තිසහගත හා අසාධාරණ බව කිසිම අවස්ථාවක රැකවරණ නිලධාරියා හෝ ඉල්ලුම්කරු ප්‍රකාශ කර නොමැති බව ඉදිරිපත් වී ඇති ලේඛනවලින් තහවුරු වේ. විනය පරීක්ෂණයෙන් පසු ඉල්ලුම්කරු චෝදනාවලට වරදකරු කර විනය දඬුවම් ලබාදීමෙන් පසු ඉල්ලුම්කරු මානව සම්පත් කළමනාකරු වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අභියාචනය ලෙස සඳහන් කර ඇති එම ලිපිය පැමිණිල්ල විසින් ඉ18 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එහිද පැවති විනය පරීක්ෂණයේ අයුක්තිසහගත හෝ ආසාධාරණ එකක් බවට කිසිදු සඳහන් නැත. ඉල්ලුම්කරු එම ලිපියෙන් ඉල්ලා ඇත්තේ ''සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව සමග පරීක්ෂණ වාර්තාව නැවත අධ්‍යයනය කර මා වෙත දඬුවම ලෙස ලබාදී ඇති දඬුවම ඉවත් කර පෙර පරිදි මාගේ රැකියාව කරගෙන යන ලෙස අවස්ථාව සලසා දෙන ලෙසය.'' අනතුරුව ඉල්ලුම්කරු විසින් කම්කරු කොමසාරිස් වෙත යවා ඇති ''ව්‍යාජ චෝදනා ගොනුකර මාගේ වෘත්තීය ජීවිතයට කරන ලද හානිය සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිල්ලයි,'' නම් වූ ලේඛනයේ ද සඳහන් කර ඇත්තේ මා වෙත ව්‍යාජ චෝදනා ගොනුකර විනය පරීක්ෂණයේ දී මෙම චෝදනා ගොනු කළ ලක්ෂ්මන් ආනන්ද මහතා විසින් එකී චෝදනා ප්‍රතික්ෂේප කර තිබියදීත් මා වැරදිකරුවෙකු ලෙස පෙන්වා මගේ රැකියාවට කරන ලද හානිය සම්බන්ධයෙන් ඔබතුමාගේ මැදිහත්වීමෙන් පරීක්ෂණයක් පවත්වා මාහට සාධාරණයක් ඉෂ්ඨ කරවාදීමට කටයුතු කරන ලෙසය.

වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී මෙම පරීක්ෂණයට අදාළ සිද්ධියෙන් පසු ඉල්ලුම්කරු විසින් සිදු කරන ලදයි කියන විනය විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් ලේඛන කිහිපයක් ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරුගෙන් ප්‍රශ්න කරන ලදී. එම සිද්ධිය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට යොමුකර ඇති 2014.02.11 දින දරන චෝදනා නමයක් සහිත චෝදනා පත්‍රය R5 ලෙසද, එම චෝදනා සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට එරෙහිව පවත්වන ලද සංක්ෂිප්ත විනය පරීක්ෂණ වාර්තාව R6 ලෙසද, එම චෝදනාවලට ඉල්ලුම්කරු වරදකරු වී ඉල්ලුම්කරුට පනවන ලද කොන්දේසි අඩංගු ලේඛනය R7 ලෙසද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලේඛන ලකුණු කර එම සිද්ධිය සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න ඇසීම ගැන ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා විරෝධය පළ කළේ ද නැත. එම සිද්ධිය සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ බවත් ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා විනය දඬුවමක් ලබාදුන් බවත් ඉල්ලුම්කරු පිළිගත්තේ ය. 2016.02.12 වන දින ඉල්ලුම්කරුගෙන් නැවත ප්‍රශ්න අසන අවස්ථාවේදී සිදු කරන ලද්දේ R5 ලෙස ලකුණු කරන ලද චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා එකිනෙක ඉල්ලුම්කරු වෙත ඉදිරිපත් කර ඇති එම චෝදනා සම්බන්ධයෙන් කුමක් කියන්නේ ද යනුවෙන් විමසීමය. ඒ අවස්ථාවේදී ඉල්ලුම්කරු සිදු කළේ එම චෝදනාවලට නිවැරදිකරු බව ප්‍රකාශ කිරීමය. ඉල්ලුම්කරු එම

චෝදනාවලට පරීක්ෂණයකින් පසු වරදකරු වී ඇති තත්ත්වයක් යටතේ මෙම අධිකරණය හමුවේ නිවැරදිකරු බව ප්‍රකාශ කිරීමෙන් ප්‍රයෝජනයක් සිදුවන්නේ නැත. තව ද මෙම පරීක්ෂණයට අදාළ සිද්ධියට පසු ඉල්ලුම්කරු සිදුකර ඇති බව තහවුරු වී ඇති එම ක්‍රියාවද මෙම සිද්ධිය පිළිබඳ නිගමනයකට එළැඹීමේදී යම් ප්‍රමාණයකට බලපෑ බව සඳහන් කළ යුතු වේ.

ලක්ෂ්මන් ආනන්ද නමැති සාක්ෂිකරුගේ සාක්ෂිය එකිනෙකට පරස්පර විරෝධී සාක්ෂියක් බව තහවුරු කිරීම සඳහා එකී පරස්පර විරෝධී කොටස් ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයේ උපුටා දක්වා ඇත. එම සාක්ෂිකරු ඉල්ලුම්කරු වෙනුවෙන් කැඳවන ලද සාක්ෂිකරු වේ. ඔහු සාක්ෂිදෙන අවස්ථාවේදී හෝ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙන අවස්ථාවේදී හෝ ඔහු මගින් වගඋත්තරකාර පාර්ශවය ලේඛන ලකුණු කළ අවස්ථාවේදී හෝ පැමිණිල්ල වෙනුවෙන් විරෝධය පළකිරීමක් හෝ එම සාක්ෂිකරු පටහැනි සාක්ෂිකරුවෙකු ලෙස නම් කිරීමක් සිදු කළේ නැත. එසේ තිබියදී පැමිණිලිකරු වෙනුවෙන් කැඳවන ලද සාක්ෂිකරුවෙකුගේ සාක්ෂියේ පරස්පරතා උපුටා දැක්වීම කිසිදු ව්‍යවස්ථාපිත නීතියකට නොගැළපෙන බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. තව ද එකී ලිඛිත දේශනයේ 2010.11.13 වන දින සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කර නොමැති බව ලක්ෂ්මන් ආනන්ද යන අය පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත්තේ සිද්ධියෙන් දින 21 පසුවීම සහ අල්ලස් පනතේ සහ ඛනිජ තෙල් සංස්ථා පනතේ වගන්ති අනුව කටයුතු කර නොතිබීම සම්බන්ධව කරුණු දක්වා ඇත. කම්කරු කොමසාරිස් විසින් මා වෙත යොමුකර ඇති ලිපියට අනුව ඉල්ලුම්කරු වැඩ තහනමට ලක්ව පසුව සිදු කරන ලද විනය පරීක්ෂණයෙන් පසු ලබා දී ඇති දඬුවම මගින් ඔහුට අසාධාරණයක් සිදුවී ඇද්ද යන කාරණයයි. පරීක්ෂණයේ දී අවධානය යොමු කරන ලද්දේ අදාළ සිද්ධියේදී ඉල්ලුම්කරුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පමණක් බව සඳහන් කළ යුතු ය.

2011.06.22 වන දින සංස්ථාව විසින් ඉල්ලුම්කරු නැවත සේවයට කැඳවීමේ ලිපිය **ඉ16** ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. මානව සම්පත් කළමනාකරු විසින් යවන ලද එම ලිපියේ සඳහන් කර ඇත්තේ විනය පරීක්ෂණ වාර්තාව අනුව ඉල්ලුම්කරු චෝදනා පත්‍රයේ සඳහන් සියලු චෝදනාවලට වරදකරු වී ඇති බවත්, එම විනය පරීක්ෂණ වාර්තාව අනුව තවදුරටත් සංස්ථා සේවයේ තබා ගැනීමට නුසුදුසු, සේවයෙන් පහ කළ යුතු බරපතල ගනයේ වැරදි සිදු කර ඇති සේවකයෙකු බව සභාපතිතුමා සටහන් කර පහත සඳහන් කොන්දේසිවලට යටත්ව නැවත සේවයට කැඳවීමට නියෝග කර ඇති බවයි. එකී කොන්දේසි නම් 2011.07.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ අවසන් වරට දරන තනතුරෙන් ශ්‍රේණි දෙකක් පහත් කර එනම් බී4 ශ්‍රේණියේ ලේඛන භාරකාර තනතුරේ නැවත සේවයට කැඳවීම, එසේ නැවත සේවයට කැඳවීමේ දී සපුගස්කන්ද පිරිපහදුවට ස්ථාන මාරු කිරීම, වැඩ තහනමට ලක්ව සිටි කාලයට අදාළ හිඟ වැටුප් නොගෙවීම, තරයේ අවවාද කිරීම, මින් ඉදිරියට සංස්ථාවේ විමර්ශන කාර්ය අංශයේ කිසිදු රාජකාරි කටයුත්තකට යොදවා නොගැනීම.

එම ලිපියේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ එම කොන්දේසිවලට යටත්ව බී4 ලේඛන භාරකරු තනතුරේ සේවය භාරගැනීමට කැමැත්තේ නම් මෙම ලිපිය වැඩබලන පිරිපහදු කළමනාකරුට ඉදිරිපත් කර අවශ්‍ය උපදෙස් ලබාගෙනන එම තනතුරට අයත් රාජකාරිවල නිරත වන ලෙසය. ඉල්ලුම්කරු එම කොන්දේසි යටතේ එම තනතුර භාරගෙන ඇත.

ඉල්ලුම්කරුගේ සාක්ෂියෙන් ද, ඔහු වෙනුවෙන් ලකුණු කරන ලද ඉ7, ඉ9 ලේඛනවලින් ද, ඉල්ලුම්කරු වෙනුවෙන් අසන ලද හරස් ප්‍රශ්නවලින්ද, ලක්ෂ්මන් ආනන්ද නමැති අයගේ සාක්ෂියෙන් ද, ඔහු වෙනුවෙන් අසන ලද හරස් ප්‍රශ්න හා ඔහුගේ සාක්ෂියේදී ලකුණු කරන ලද R2, R4, R9, R10 ලේඛනවලින්ද සමස්ථයක් ලෙස සලකා බලන විට පැහැදිලි වන්නේ ඉල්ලුම්කරු විසින් නිකවැරටිය ඉන්ධන පිරවුම්හලේ විමර්ශන කටයුතුවල නියැලී සිටි ලක්ෂ්මන් ආනන්ද නමැති අයට දුරකතන ඇමතුම් ලබාදී චෝදනා පත්‍රයේ සඳහන් ක්‍රියාවන් සඳහා බලපෑම් කරන ලද බවයි. එම නිසා ඔහු වෙත ඉදිරිපත් කරන ලද චෝදනා සම්බන්ධයෙන් විමර්ශනයක් කළ විනය පරීක්ෂණයේ ඔහු වරදකරු කරමින් කරන ලද නියෝගය වෙනස් කිරීමට කිසිදු සාධාරණ හේතුවක් මට නොපෙනේ.

ඉල්ලුම්කරුට ලබාදී ඇති දඬුවම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය සඳහන් කරන්නේ සංස්ථා විනය ව්‍යවස්ථාව අනුව යම්කිසි නිලධරයෙකු යම්කිසි වරදකට වරදකරු වූ අවස්ථාවක දරන ලද තනතුරෙන් පහ කිරීමට නීතිමය ප්‍රතිපාදන තිබුණ ද ඉල්ලුම්කරු දෙස සානුකම්පිතව බලා යුක්තිසහගත හා සාධාරණ ලෙස ක්‍රියාකර ඇති බවයි. මෙම නඩුවේදී ඉදිරිපත් වූ සාක්ෂි හා ලේඛන අධ්‍යයනය කිරීමෙන් පසු මාගේ නිගමනය වන්නේ 2011.01.06 වන දින සිට වැඩ තහනමකට ලක්ව පසුව සිදු කරන විනය පරීක්ෂණයකින් අනතුරුව වැඩ තහනමට ලක්ව සිටි කාලයට වැටුප් රහිතව තරයේ අවවාද කර තනතුරෙන් ශ්‍රේණි දෙකක් පහත හෙළා ස්ථාන මාරු කර ලබාදී ඇති දඬුවමින් ඒ. ජී. ජීවා පුෂ්ප කුමාර මහතාට අසාධාරණයක් සිදුවී නැති බවයි.

බේරුම්කරු.

2019 ජනවාරි මස 04 වැනි දින දී ය.

04 – 276

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.